# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,395 - 2024 ජූලි මස 26 වැනි සිකුරාදා - 2024.07.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 254 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 255 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 අගෝස්තු මස 16 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 අගෝස්තු මස 02 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය.''**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## ගම්පහ දිසා අධිකරණයේ දී ය

## පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. 2085, කොළඹ 02 සහ අංක 27, රණතුංග පාර, ගම්පහ.

නඩු අංකය : 148/MB
ස්වභාවය : උකස්
ක්‍රියාපටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු. 1,100,322.10
ඇස්කීසි අංකය : 04/2023

*................පැමිණිලිකරු.*

*එදිරිව*

පතිරාජ ලියනගේ ලක්ෂමන් ප්‍රදීප් කුමාර,
අංක 310/ඒ, හංසගිරි පාර,
ගම්පහ.

*....................විත්තිකරු.*

148/MB නඩු අංකයෙන් විත්තිකරුගෙන් **2012.05.31** දින වනවිට අයවිය යුතු මූලික ණය ශේෂය වන **රුපියල් පන් ලක්ෂ අනූ තුන් දහස් එකසිය අසූ පහයි ශත අසූ හතරක්** (රු. 593,185.84) සහ **2012.06.01** දින සිට එකී **රුපියල් පන් ලක්ෂ අනූ තුන් දහස් එකසිය අසූ පහයි ශත අසූ හතරක** (රු. 593,185.84) ක මුදල මත වාර්ෂිකව 16.90% ක් වූ පොළියක්, එකී දින සිට ම විත්තිකරු විසින් නිසි පරිදි වාරික නොගෙවීම මත එකතු වී ඇති හිඟ වාරික මුදල් වන **රුපියල් තුන් ලක්ෂ අසූපන් දහස් අනූ අටයි ශත පහලොවක** (රු. 385,098.15) මුදලක් ද **2012.05.31** වැනි දිනට එකී හිඟ වාරික මුදල් සඳහා මාසිකව එකතු වී ඇති 2% බැගින් වූ අමතර පොළිය වන, **රුපියල් එක් ලක්ෂ පහලොස් දහස් හයසිය හතයි ශත විසි තුනක** (රු. 115,607.23) මුදල ගෙවා අවසන් වනතුරු එකී මුදල මත මාසිකව 2% බැගින් වූ අමතර පොළිය ද, අයකර ගැනීමේ කටයුතු වෙනුවෙන් දරන ලද මුදල වන **රුපියල් හය දහස් හාරසිය තිහයි ශත අසූ අට** (රු. 6,430.88) මෙම නඩුවේ තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට සම්පූර්ණ මුදලම අයකර ගන්නා දිනය තෙක් එකී සම්පූර්ණ මුදල මත නෛතික පොළිය ද, නඩු ගාස්තු, ඇස්කීසි ගාස්තුව සහ වෙනත් වියදම් ද, ඉහත කී විත්තිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ සම්බන්ධයෙන් ඔවුන්ට අයත් සියලු අයිතිවාසිකම් හා හිමිකම්,

වර්ෂ **2024ක් වූ අගෝස්තු** මස **28** වැනි දින එම දේපළ පිහිටි ස්ථානයේ දී **ප. ව. 1.00** ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ මහ නගර සභා සීමාවේ, යක්කල (උප කාර්යාලයේ) ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 231 සී, යක්කල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, යක්කල ග්‍රාමයේ හෙට්ටියාදෙණිය පාරේ, වරිපනම් අංක 111/25 හි පිහිටි ඇටඹගහවත්ත නැමති ඉඩමට 2003/01/20 වැනි දින මර්වින් සමරනායක මානක තැන විසින් මැන සම්පාදිත අංක 8419 පිඹුර ප්‍රකාර කැබලි අංක 33 කොටසට මායිම්,

උතුරට : කැබලි අංක 52 ද,
නැගෙනහිරට : කැබලි අංක 34 හා 32 ද,
දකුණට : කැබලි අංක 13 ද,
බටහිරට : කැබලි අංක 16 සහ 52 ද

යන මායිම් තුළ පිහිටි පර්චස් හතයි දශම පහයි (පර්. 7.50) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගහකොළ පලතුරු ආදී සියළු දේ ද මාර්ග පරවශ්‍යතාවයන් ද සමග ගම්පහ ඉඩම ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 44/57 හි ලියාපදිංචි කර ඇත.

අධිකරණයේ අණ පරිදි,

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
ගම්පහ.

07-651

# විවිධ දැන්වීම්

## පාර්ලිමේන්තුව

### මහරගම තරුණ බෞද්ධ සංගමය

1998 අංක 19 දරන මහරගම තරුණ බෞද්ධ සංගමය සංස්ථාගත කිරීමේ පනත සංශෝධනය කිරීමේ යෝජිත පනතකි

උදය ගම්මන්පිල වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "1998 අංක 19 දරන මහරගම තරුණ බෞද්ධ සංගමය සංස්ථාගත කිරීමේ පනත සංශෝධනය කිරීමේ පනත් කොටුම්පත'' පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් සංශෝධන එකී පනතට ඇතුලත් කිරීමයි :-

(1) ප්‍රධාන ප්‍රඥප්තියේ ''කළමනාකරණ මණ්ඩලය'' යන වචන වෙනුවට "කෘත්‍යාධිකාරී මණ්ඩලය" යන වචන ආදේශ කිරීම ;

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "සභාපති උප සභාපතිවරු තිදෙනෙක්, ලේකම්, සහකාර ලේකම්, භාණ්ඩාගාරික, සහකාර භාණ්ඩාගාරික සහ තවත් සාමාජිකයින් විසිහතරක්" යන වචනය වෙනුවට "සභාපතිවරයෙක්, ලේකම්වරයෙක්, භාණ්ඩාගාරිකවරයෙක්, නියෝජ්‍ය සභාපතිවරයෙක්, නියෝජ්‍ය ලේකම්වරයෙක්, නියෝජ්‍ය භාණ්ඩාගාරිකවරයෙක්, උප සභාපතිවරු තිදෙනෙක්, උප ලේකම්වරු තිදෙනෙක්, උප භාණ්ඩාගාරිකවරු තිදෙනෙක් සහ තවත් සාමාජිකයින් විසිහතර දෙනෙකුගෙන්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්ති සංශෝධනය කිරීම ;

යනාදිය වේ.

උදය ගම්මන්පිල,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

07-631

---

## ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් (කොළඹ දී පවත්වනු ලබන)

## බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය.

නඩු අංකය : CHC/39/2024/CO.
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම
කාර්ය පටිපාටිය : ලඝු

වත්තල, හැඳල, සනී ගුණවර්ධන මාවත, අංක 72/78 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි අංක (PV 6567) දරන ඒ. එම්. එල්. යුනිවර්සල් ට්‍රේඩින්ග් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා වූ කාරණයේ දී ය.

සින්නයියා මනිවන්නන්,
අංක 72/78, සනී ගුණවර්ධන මාවත,
හැඳල, වත්තල.

......................*පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් සමාගම ගණන් හිලවු බේරා වසා දැමීම සඳහා සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණය වෙත 2024 ජුනි 14 වැනි දින පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එම පෙත්සම 2024 ඔක්තෝබර් මස 01 වැනි දින අධිකරණය ඉදිරියේ දී ඇසීමට නියම කර ඇති බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ. එම පෙත්සම පිළිබඳව නියෝගයක් ලබාදීමට කැමති හෝ ඊට විරුද්ධ වන ඕනෑම ණය හිමියෙකුට හෝ එකී සමාගමෙහි දායකයකුට නඩුව කැඳවන අවස්ථාවේ දී පුද්ගලිකව හෝ සිය නීතිඥවරයා මාර්ගයෙන් පෙනී සිටිය හැකි අතර, පෙත්සමෙහි පිටපතක් එය අවශ්‍ය කෙරෙන ඕනෑම ණය හිමියෙකුට හෝ එකී සමාගමෙහි දායකයෙකු වෙත ඒ සඳහා වන නියමිත ගාස්තු ගෙවීමෙන් පසුව පහත අත්සන් තබා ඇති අය විසින් ලබාදෙනු ඇත.

ඒ. ඩී. ශ්‍යාමලී අයි. අතුකෝරල,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 166/1, අලුත්කඩේ වීදිය, කොළඹ 12.

***සටහන.-*** එකී පෙත්සම අඬගසනු ලබන අවස්ථාවට පෙනී සිටීමට කැමැත්තක් දක්වන ඕනෑම පුද්ගලයෙකුට ඔහු එසේ කැමැත්තෙන් සිටින බව ඉහත නම් සඳහන් පෙත්සම්කරුගේ නීතිඥවරයා වෙත ලිඛිතව තැපෑලෙන් දැන්විය යුතු ය. *නැතහොත්* ගෙනැවිත් භාරදිය යුතු ය. එම නිවේදනයෙහි පුද්ගලයාගේ නම, ලිපිනය සහතික කළ යුතු ය. එසේ *නැතහොත්* තම නීතිඥවරයා (සිටී නම්) මාර්ගයෙන් භාරදිය යුතු ය. තැපෑලෙන් එවනු ලබන්නේ නම් **2024 සැප්තැම්බර් මස 30 වැනි දින පස්වරු 6.00ට පෙර ඉහත නම් සඳහන් අය වෙත ලැබෙන පරිදි** එවිය යුතු ය.

07-684

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.